වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය - 2024

වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 2.09 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, එවකට මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආර්ථික ක්‍රියාකාරකම් සහ කලාපීය ඒකාබද්ධතාවය මත ධනාත්මක බලපෑමක් ඇති කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. අනෙකුත් කරුණු ද ඇතුලත්ව, කොළඹ නගරයේ රථවාහන තදබදය පහසු කිරීම, කොළඹ සිට කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා ගමන් කාලය අඩු කිරීම සහ වරායේ සිට කොළඹ වෙනත් ප්‍රදේශ දක්වා භාණ්ඩ ප්‍රවාහනයේ දී ඇතිවන රථවාහන තදබදය පහසු කිරීම යනාදිය මෙහි අපේක්ෂිත ප්‍රතිලාභ වේ. කොළඹ මහාමාර්ගවල බහාලුම් සංචලනයේ අපේක්ෂිත අඩුවීම හේතුවෙන්, කොළඹ තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදයද අඩු කිරීමට අපේක්ෂා කෙරේ. වැඩ සහ උපකරණ, උපදේශන සේවා, ව්‍යාපෘති කළමනාකරණය, පොලී සහ ප්‍රයාපන ගාස්තු යන සංරචක හතරක් යටතේ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 56, 850.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 360.20ක් වන අතර ඉන් රු. මිලියන 47,349 කට සමාන එ.ජ.ඩො. මිලියන 300 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 9, 501.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 60.20ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ විය.

ව්‍යාපෘතිය එහි කටයුතු 2016 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර 2025 වර්ෂයේ ජුනි 30 දින නිම කිරීමට නියමිත විය.

1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන මගින් 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය දරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරණ ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය දරන පාර්ශවයන් දැනුවත් කරමි.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

	ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණ	මුදල රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශ
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 07 වන ඡේදය ප්‍රකාරව, ගනුදෙනු සහ අනෙකුත් සිදුවීම් සිදුවන අවස්ථාවේ දී හඳුනා ගනු ලැබේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ A කොටසේ විශේෂ කොන්දේසිවල 14.1(ආ) (ii) උප වගන්තියට අනුව 2022 පෙබරවාරි 19 සිට 2024 ඔක්තෝබර් 18 දක්වා කොන්ත්‍රාත්කරුට ලබාදුන් 1,252,990,115ක් වූ බදු සහන ප්‍රතිලාභය මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. ඒ හේතුවෙන් ඊට සමාන අගයකින් ලැබිය යුතු මුළු ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.	1,252,990,115	කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති බදු සහ තීරුබදු සහනවලට අදාළ කොන්ත්‍රාත් කොන්දේසි සහ විධිමත් විධිවිධාන කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට සියලුම ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙනු ලැබේ.	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ ආකෘතියට අනුකූල වන බවට ගණකාධිකාරීවරයා විසින් සහතික විය යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 07 වන ඡේදයට අනුව, ගනුදෙනු සහ සිදුවීම් ගිණුම්කරණ වාර්තාවල සටහන් කළ යුතු අතර අදාළ පරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයට අදාළ ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද අතුරු ගෙවීම් සහතික 03 ක් ප්‍රතිපාදනයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේදී කෙරීගෙන යන වැඩ රු. 73,692,567 කින් අඩුවෙන් දක්වා තිබුණි.	73, 692,567	පිළිගනිමි. අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉංජිනේරුවරයා විසින් IPC 56 සහතික කර ඉදිරිපත් කර නොමැත. ඒ හේතුවෙන්, ගිණුම් පොත්වල ප්‍රතිපාදන සැලසිය නොහැකි විය.	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ ආකෘතියට අනුකූල වන බවට ගණකාධිකාරීවරයා විසින් සහතික විය යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 5 හි 43(අ) ඡේදයට අනුව, වත්කම් සහ වගකීම් මූල්‍ය	රු. මිලියන 213.84 සහ රු.මිලියන	වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා රඳවා ගැනීමේ ගෙවීම අවසන්	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ ආකෘතියට අනුකූල

	තත්ත්ව ප්‍රකාශනයේ දිනට අවසන් විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් 2024 දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය අනුපාතය භාවිත කරමින් පරිවර්තනය කර නොතිබුණි. ඒ හේතුවෙන්, ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය සහ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් ශේෂය රුපියල් මිලියන 213.84 කින් සහ රුපියල් මිලියන 153.52 කින් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි.	153.52	විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කිරීමට සටහන් කර ගන්නා ලදී.	වන බවට ගණකාධිකාරීවරයා විසින් සහතික විය යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 88 සහ 89 ඡේදවලට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි එක් එක් උප කාණ්ඩ තුළ අදාළ අයිතම ඇතුළත් විය යුතු අතර, එවැනි ඉදිරිපත් කිරීමක් ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ අවබෝධයට අදාළ වන විට, අතිරේක අදාළ අයිතම, ශීර්ෂ සහ උප එකතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුහුණතෙහි ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කෙරීගෙන යන වැඩ යටතේ ගුවන් මාර්ගය සහ සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය යන ප්‍රධාන වත්කම් දෙකකින් ව්‍යාපෘතිය සමන්විත වේ. 2024 දෙසැම්බර් 31 දක්වා මෙම ව්‍යාපෘති සංරචක දෙක සඳහා රුපියල් මිලියන 65,850 ක මුදලක් වැය කර ඇත. ප්‍රධාන වත්කම් දෙක යටතේ වෙන වෙනම නොදක්වා සියලු පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ ඇතුළත් කර තිබිණි.	රු. මිලියන 65,850	මධ්‍යස්ථාන පිරිවැය සම්බන්ධයෙන් අවශ්‍ය පිරිවැය අවශෝෂණය ව්‍යාපෘති අවසන් අදියරේදී සිදු කෙරේ.	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ ආකෘතියට අනුකූල වන බවට ගණකාධිකාරීවරයා විසින් සහතික විය යුතුය
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 2 හි 55 ඡේදයට අනුව, මුදල් නොවන චලනයන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	රු. මිලියන 73,619 සහ රු. මිලියන 14.773	පිලිගනිමි. නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක්	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල වන බවට ගණකාධිකාරී සහතික

ලැබෙන මුදල් ප්‍රවාහ යටතේ ගැලපුම් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 වර්ෂය සඳහා විදේශ විනිමය අනුපාතයේ වෙනස්වීම් හේතුවෙන් ඇති වන විනිමය ලාභය මත රු. මිලියන 14.77 ක මුදලක් ඊට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපුම් කර නොතිබුණි.	අමුණා ඇති අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල නිසි පරිදි ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.	විය යුතුය.

2.2 නොසැසඳු ශේෂ

මූල්‍ය ප්‍රකාශන අනුව අගය රු.	අනුරූපී වාර්තා අනුව අගය රු.	අනුරූපී වාර්තාවේ විස්තරය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශ
5,625,199	6,262,015	මාර්ග සංවර්ධන අධිකාරියේ 2024 මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය, PMU කාර්ය මණ්ඩලයේ ලැබිය යුතු වැටුප ප්‍රතිපූරණය කිරීම.	පිළිගනිමි.	ශේෂයන් ලෙජර් ශේෂයන් සමඟ සැසඳෙන බවට ගණකාධිකාරී සහතික විය යුතුය.

2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම /විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශ
(අ)	2019 මාර්තු 15 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 උප වගන්තිය.	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු අතර, එමඟින් එම පද්ධතියේ කාර්යක්ෂමතාව නියාමනය සඳහා ව්‍යාපෘතිය වරින් වර සමාලෝචන සිදු කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා ඇති අතර 2019 වසරේ සිට 2023 වසර දක්වා මෙහෙයුම් කමිටු රැස්වීම් අටක් පමණක් පවත්වා තිබුණි. එය ව්‍යාපෘති	2024 වර්ෂය සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී.	චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.

		ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකළ හැකිය.		
(ආ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛයට පටහැනිව, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මගින් පැමිණීම් සහ පිටවීම් තහවුරු නොකර අතිකාල දීමනා ලෙස රු. 592,426.64 ක මුදලක් ගෙවා තිබුණි.	2024.10.23 දින ඇඟිලි සලකුණු යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් පසුව, ව්‍යාපෘති කාර්යාලය විසින් චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව කාර්ය මණ්ඩලයට අදාළ අතිකාල ගෙවීම් සිදු කරන ලදී.	චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.
(ඇ)	2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය.	ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	පිලිගනිමි. නිවැරදි කිරීමේ පියවර ගනිමින් පවතී.	චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.
(ඈ)	2024 ඔක්තෝබර් 24 දිනැති අංක DMA/2/2024 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 වගන්තිය.	2021 අප්‍රේල් 30 දින සිට ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.	බඳවා ගැනීමේ ක්‍රියාවලිය තවමත් සිදුවෙමින් පවතී.	චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.
(ඉ)	2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි 2.3.2 වගන්තිය සහ 2024 ඔක්තෝබර් 24 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2/2024 හි 4.1.1 වගන්තිය.	ව්‍යාපෘති කළමනාකරණයේ ඵලදායිබව සහතික කිරීම සඳහා පූර්ණ කාලීන පදනමින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කළ යුතු වුවද, 2021 මාර්තු 15 වන දින සිට ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර වැඩබලන පදනමින් පත් කර තිබුණි.	ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා පූර්ණ කාලීන පදනමින් බඳවා ගැනීම සඳහා 2025.05.07 දින දැන්වීමක් පල කර ඇත. මේ දිනවල බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.	චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.

3. **භෞතික කාර්යසාධනය**

3.1 **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

සංරචකය	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට		ප්‍රමාදය / විගණන නිරීක්ෂණය	ප්‍රමාදයට හේතු
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක / ප්‍රතිශතය	අත්කර ගත් කාර්ය සාධනය ඒකක / ප්‍රතිශතය		
(අ) වරාය පිවිසුම් ගුවන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු	ඉදිකිරිම	100	97.4	වරාය පිවිසුම් ගුවන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 සැප්තැම්බර් 27 දින ආරම්භ කර තිබූ අතර, සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව ප්‍රකාරව දින 1,095ක ඉදිකිරීම් කාලයක් සහිත 2022 සැප්තැම්බර් 25 දින නිම කිරීමට මුලික වශයෙන් සැලසුම් කර තිබුණි. COVID-19 වසංගතය, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ අවස්ථා 7 කදී මිනිස් ඇටසැකිලි සොයා ගැනීම නිසා ඇති වූ බාධා හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දින 837ක කාල දීර්ඝ කිරීමක් අනුමත කර ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2025 මැයි 6 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, සිවිල් වැඩ කාල සටහන හය වතාවක් සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, 100%ක සැලසුම් කළ ප්‍රගතියට සාපේක්ෂව 2024 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩවල සමස්ත	ප්‍රමාදය සඳහා හේතු වූ කරුණු කිහිපයක් පහත දැක්වේ. ප්‍රධාන වශයෙන්, කොවිඩ් 19 වසංගතය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය භූමියේ හිමිකාරිත්වය ලබා දීම ප්‍රමාද කිරීම, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ වැඩ බිම තුළ මිනිස් ඇටසැකිලි සොයා ගැනීම.

				ප්‍රගතිය සියයට 97.4ක් විය. මේ අනුව, 2024 දෙසැම්බර් 31 වන විට දින 1,783ක කාලයක් ගතවී තිබුණි.	
	කළමනාකරණයේ අදහස් දැක්වීම	දීර්ඝ කරන ලද නිම කිරීමේ දිනය 2025 මැයි 6 වේ. මුල් විෂය පථයෙන් 100% ක් 2024 සැප්තැම්බර් වන විට සම්පූර්ණ කළ යුතුව තිබුණද, ඇටසැකිලි පිළිබඳ විමර්ශන කටයුතු තුළින් ඇති වූ බාධාව හේතුවෙන් 94% ක් පමණක් සම්පූර්ණ කළ හැකි විය. කොන්ත්‍රාත්කරු විසින් 2024 සැප්තැම්බර් මාසයේදී වැඩසටහන (වැඩසටහන් සංශෝධනය - 7) සංශෝධනය කරන ලදී. සංශෝධිත වැඩසටහනට අනුව සැලසුම් කළ ප්‍රගතිය 97.4% ක් වූ අතර එය අත්කර ගත හැකි විය.			
	විගණකගේ නිර්දේශ	විධිමත් පරීක්ෂණයක් පවත්වා කාලය දීර්ඝ කිරීම (EOT) සිදු කිරීමේදී, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි (COC) අනුව සේවායෝජකයාගේ අයිතිවාසිකම් තහවුරු කර ඇති බව සහතික කළ යුතුය.			
(ආ)	සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම	75.8	45	සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි මාසයේදී ආරම්භ කර 2022 පෙබරවාරි වන විට අවසන් කිරීමට 2019 වර්ෂයේ මූලික ක්‍රියාකාරී සැලැස්මට අනුව නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් ආරම්භ කිරීමට නියමිත දිනය වූ 2021 ජූලි 07 සිට මාස 17ක කාලයකට පසු රුපියල් මිලියන 4,999.43ක කොන්ත්‍රාත් මිලකට වසර 02 ක කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. අවස්ථා 09 කදී සමස්ත දින 778 ක කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇති අතර අවසන් කිරීමේ දිනය 2025 අගෝස්තු 22 ලෙස සංශෝධනය කර තිබුණි.	COVID 19 වසංගතයේ බලපෑම, අහිතකර දේශගුණික තත්ත්වයන්, සේවායෝජක අවශ්‍යතාවයන් අනුව වෙනස් කිරීම් සිදු කිරීම, කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහ ගැටළු, පරිපූරක ගිවිසුම අත්සන් කිරීමේ ප්‍රමාදය සහ ඇමරිකානු ඩොලර් මිල ඉහළ යාම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇත.

කළමනාකරණයේ අදහස් දැක්වීම	කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැරව තිබෙන කරුණු හේතුවෙන් 2025 මැයි මාසය තුළ ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වූ බැවින්, 2025 අගෝස්තු 22 දින දක්වා තවදුරටත් කාලය දීර්ඝ කිරීම් අනුමත කරන ලදී. ඒ අනුව වර්තමානයේ දී කොන්ත්‍රාත්කරු 6 වන වැඩසටහන් සංශෝධනය අනුව කටයුතු කරමින් සිටී.
විගණකගේ නිර්දේශ	විධිමත් පරීක්ෂණයක් පවත්වා කාලය දීර්ඝ කිරීම (EOT) සිදු කිරීමේදී, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි (COC) අනුව සේවායෝජකයාගේ අයිතිවාසිකම් තහවුරු කර ඇති බව සහතික කළ යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශ
(අ)	කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල A කොටසේ 14.1 ආ (ii) උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු අගය එකතු කළ බද්ද හැර, පරිභෝජන ද්‍රව්‍ය (ස්ථිර පදනම) සඳහා වන සියලුම තීරුබදු, බදු, රේගු බදු සහ අනෙකුත් ගාස්තු ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද අනුපාත, මිල ගණන් සහ මුළු ලංසු මිලට ඇතුළත් කළ යුතුය. එමෙන්ම, එම උප වගන්තියේ (ආ) හි සඳහන් කර ඇති පරිදි, "වැඩ සම්බන්ධයෙන් රජය විසින් රේගු බදු, සුරා බදු, වැට් බදු හෝ වෙනත් ගාස්තු නිදහස් කළහොත්, එහි ප්‍රතිලාභ සේවායෝජකයා වෙත ලබාදිය යුතුය". මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.		
	i. කොන්ත්‍රාත්තුවේ විශේෂිත කොන්දේසිවල A කොටසෙහි 14.1(ආ) වගන්තියට අනුව ගෙවන ලද සියලුම බදු හා තීරු බදු පිළිබඳ ඉතා නිවැරදි වාර්තා පවත්වා ගැනීම, ඉංජිනේරුවරයා / සේවායෝජකයා විසින් ඉල්ලා සිටින විට මෙම වාර්තා සැපයීම කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ යුතු වුවද, කොන්ත්‍රාත්කරු සමඟ නිසි ලෙස සම්බන්ධීකරණය වෙමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය තොරතුරු ලබාගෙන නොමැත.	මෙම කාලය පුරාම කොන්ත්‍රාත්කරු විසින් වාර්තා පවත්වාගෙන යන ලදී. නැව්ගත කිරීමේ (CUSDEC) ලේඛන ඇතුළු සියලුම වාර්තා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ලිපිගොනු තුළ පවත්වාගෙන යනු ලැබේ. බදු සහන පිළිබඳ විස්තර එම ලිපිගොනු වලින් ලබා ගත හැකිය.	කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූලව ඉතා නිවැරදි වාර්තා කොන්ත්‍රාත්කරු විසින් පවත්වාගෙන යන බවට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සහතික විය යුතුය.
	ii. කොන්ත්‍රාත්කරු සමඟ සම්බන්ධීකරණය වෙමින් ඉන්වොයිසි 226 යටතේ ස්ථාවර සහ තාවකාලික පදනම යටතේ ආනයනය කරන ලද තොග සඳහා අවශ්‍ය ප්‍රමාණයන්, ආනයනය කරන ලද ප්‍රමාණයන්, ඒවායේ වටිනාකම් සහ ප්‍රති-අපනයන සඳහා අදාළ බදු සහන ප්‍රමාණයන් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය හරහා රටට	කාර්යාලය තුළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලැබේ. තවද, පවත්වාගෙන යනු ලබන ලිපිගොනු තුළින් සියලුම රේගු සටහන් (CUSDEC) ආකෘති ලබා ගත හැකි අතර, අවශ්‍ය දත්ත එම ලේඛන මගින් ලබා ගත හැකිය. ආනයනය කරන	ලබාගත් අනවශ්‍ය ප්‍රතිලාභ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් වහාම පියවර ගත යුතු අතර, විධිමත් පරීක්ෂණයක් පවත්වා

	ආනයනය කරන ලද එක් එක් තොගයේ ප්‍රමාණය, ව්‍යාපෘතිය සඳහා භාවිත කරන ලද ප්‍රමාණය සහ භාවිතයට නොගත් ප්‍රමාණය පිළිබඳ තහවුරුවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබිණි. ඒ අනුව, කොන්ත්‍රාත්කරුගෙන් අවශ්‍ය වාර්තා ලබා ගැනීමට නොහැකි වීම සහ කොන්ත්‍රාත්කරුගෙන් අදාළ ප්‍රතිලාභ ලැබීමෙන් පසු අරමුදල් අයකර ගැනීමට කාලීනව පියවර නොගැනීම විගණනයේදී සැලකිය යුතු ගැටළු වශයෙන් හඳුනා ගන්නා ලදී. ඒ හේතුවෙන්, ශ්‍රී ලංකා රේගුව ඉන්වොයිසි 226 ක් සඳහා 2022 පෙබරවාරි 19 දින සිට ඉදිරියට ලබා දී තිබූ CID, CESS සහ PAL ඇතුළු රු. 1,252,990,115ක් වූ බදු සහන ප්‍රතිලාභය ව්‍යාපෘතිය විසින් ලබාගෙන නොමැත	ලද ප්‍රමාණයන් පිළිබඳ විස්තර දැනටමත් විගණන කාර්යාලයට ඉදිරිපත් කර ඇත. භාවිත කළ සහ ඉතිරි ප්‍රමාණයන් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙස කොන්ත්රාත්කරුගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ආනයනය කරන ලද ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුළ අන්තර්ගත වේ. බදු සහන ප්‍රතිලාභ සඳහා හිමිකම් මෙම තොරතුරු භාවිත කරමින් සකස් කරන ලද අතර එය ඉංජිනේරුවරයා විසින් ඇගයීමට ලක් කරනු ලැබේ.	කොන්ත්‍රාත්තුවේ කොන්දේසි (COC) අනුව සේවායෝජකයාගේ අයිතිවාසිකම් තහවුරු කර ඇති බවට සහතික කළ යුතුය.
(ආ)	වරාය අධිකාරිය සඳහා සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය සැලසුම් කිරීම, වැඩ ඒකක සහ ටැඹ අත්තිවාරම ඉදිකිරීමට අදාළ උපදේශන සේවා සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) අතර කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කරන තිබිණි. ඒ යටතේ ටැඹ අත්තිවාරම විස්තරාත්මක සැලසුම් කිරීම, ලංසු ලිපිලේඛන සකස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ සැලසුම් සමාලෝචනය කිරීමට සිදු වූ අතර ගිවිසුම 2024 ජනවාරි මස කල් ඉකුත් වී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ වැඩ ගිවිසුම දීර්ඝ කිරීම නිසා, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද සියළුම සැලසුම් සමාලෝචනය කිරීම සඳහා CECB සමග තිබෙන ගිවිසුම පරිපූරක ගිවිසුමක් මගින් මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි. පරිපූරක ඇස්තමේන්තු අංක 01 හි 03 වන වගන්තිය අනුව,2024 ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා ව්‍යාපෘතිය රුපියල් 1,142,562 ක මාසික අතිරේක දීමනාවක් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශයට (CECB) ගෙවීමට බැදී සිටි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ රුපියල් 13,710,745 ක් CECB වෙත ගෙවා තිබුණි.	පිළිගනිමි. SLPA. විසින් යෝජනා කළ පරිදි සේව්‍යයාගේ අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කරන ලද නවීකරණයන් නිසා සැලසුම් වරින් වර වෙනස් කරන ලදී.මෙය සැලසුම් සමාලෝචන කාලසීමාව දීර්ඝ කිරීමට හේතු විය.	විධිමත් පරික්ෂණයක් පවත්වා කාලය දීර්ඝ කිරීමේදී (EOT) නිකුත් කිරීමේදී ගිවිසුමේ කොන්දේසි (COC) වලට අනුකූලව සේව්‍යයා යෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වී ඇතිද යන්න සහතික කල යුතුය.
(ඇ)	i. වරාය පිවිසුම් ගුවන්මාර්ග ව්‍යාපෘතියේ විශේෂිත කොන්ත්‍රාත් කොන්දේසිවල “අ” කොටසේ අංක 14.5 වගන්තිය අනුව, වැඩබිමේ තිබෙන අයිතම 08ක් සඳහා ගෙවීමට ඉඩ දිය හැකි බවට හඳුනාගෙන ඇති අතර, IPC 37 අනුව 2024 අප්‍රේල් 30 දිනට අයිතම අටක් ඇතුළත්ව වැඩ බිමේ	පහත කරුණු වලට යටත්ව පිළිගනිමි. ඉංජිනේරුවරයාගේ ගණනය කිරීම් අනුව,2024 නොවැම්බර් මස අවසානයේ වැරගැන්වීම් ටොන් 903 ක් ඉතිරිව තිබුණි. මෙම	විධිමත් පරික්ෂණයක් පවත්වා වැඩ බිමේ තිබෙන ද්‍රව්‍ය වලට ගෙවන විට කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේව්‍යයා යෝජකයාගේ

	තිබෙන රුපියල් 3,986,676,473.46 වටිනා භාණ්ඩ හඳුනා ගෙන තිබිණි. කෙසේනමුත්, 2024 නොවැම්බර් 30 දිනට භෞතික ප්‍රගතිය සියයට 98 ක් ළඟා කර ගෙන තිබුනද වැරගැන්වීම් අයිතම වර්ග 05 ක් භාවිත කර නොතිබුණු අතර 2024 නොවැම්බර් 30 දිනට IPC 54 අනුව, කොන්ත්‍රාත්කරුට වැඩ බිමේ ද්‍රව්‍ය ලෙස රුපියල් 547,350,000 වටිනා වැරගැන්වීම් ටොන් 1,230 ක් ඉතිරි සියයට 2 ක් වූ භෞතික ප්‍රගතිය සඳහා පැවතුනි.	ප්‍රමාණයෙන් ටොන් 336 ක් වැඩ වල මුල් විෂයපථය සඳහා අවශ්‍ය කෙරේ.අනෙකුත් ප්‍රමාණය වන ටොන් 567 කොන්ත්‍රාත්කරු විසින් අනාගත වැඩ සඳහා වැඩබිමේ තබා තිබුණි.	අයිතිවාසිකම් ආරක්ෂා වී ඇතිද යන්න සහතික කල යුතුය.
ii.	ව්‍යාපෘතිය විසින් ලබා දුන් තොරතුරු අනුව ප්‍රදානය කර තිබෙන කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ සඳහා මෙම ද්‍රව්‍ය අවශ්‍ය නොවන බව හඳුනා ගෙන ඇති අතර එය රුපියල් 179,068,000 වටිනා වැඩ බිමේ තිබෙන වැරගැන්වීම් ටොන් 503 ක් වැඩිපුර ද්‍රව්‍ය ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව, IPC 37 යටතේ ගෙවීම් සිදු කල 2024 අප්‍රේල් 30 දින සිට අනිසි මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුට ඉඩ ලබා දී ඇත. තවද, වැඩ බිමේ තිබෙන ද්‍රව්‍යයන් සඳහා ගෙවා තිබුණද මෙම ද්‍රව්‍යයන් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් අවශ්‍ය නොවන තොග ලෙස සැලකේ. එහි ප්‍රතිඵලයක් ලෙස,සත්‍ය වැඩ ප්‍රගතිය වැඩබිමේ ද්‍රව්‍යයන් සඳහා ගෙවීම් සමග අනුගත නොවේ. පෙර IPC වටිනාකම වැඩ බිමෙහි තිබෙන ද්‍රව්‍යයන් ඇතුළත්ව වර්තමාන IPC වටිනාකමෙන් අඩු කර තීරණය කරනු ලබන ශුද්ධ අගයන්හි ප්‍රවණතාවය විශ්ලේෂණය කිරීමේදී විෂමතාවයක් පෙන්නුම් කරයි. සැලකිය යුතු පරිදි, මෙම ප්‍රවණතාවය IPC අංක 45 සිට අඩුවෙමින් පවතී. උපදේශකවරයාගේ යොමු කිරීමේ නියමයන්හිදී (Terms of Reference) ඈ (iv) වගන්තියේ සඳහන් පරිදි, IPC පරික්ෂා කිරීමේදී සහ නිර්දේශ කිරීමේදී අධීක්ෂණ උපදේශකට ඔවුන්ගේ රාජකාරී ඉටු කිරීමට අසමත්වීම හේතුවෙන් මෙම තත්ත්වය පැන නගින ලදී. ඒ අනුව, සමාලෝචිත වර්ෂය දක්වා ගෙවූ රුපියල් 2,452,771,489 වූ උපදේශන ගාස්තුව පිලිබඳව විගණනය සෑහීමකට පත් නොවේ.	පහත කරුණු වලට යටත්ව පිළිගනිමි. වැඩ වල කඩිනම් බව සහ අලුත් වැඩ අවසන් වන තුරු ඉතිරි ද්‍රව්‍ය තොගය රඳවා තබා ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුට දන්වන ලදී.මෙම හේතුව සඳහා වැරගැන්වීම් ප්‍රමාණය වැඩ බිමේ තිබිය යුතු ලෙස පිළි ගැනේ. කෙසේනමුත්, VO-60 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ එකගතාවය තවමත් ලැබී නොමැත.විචලනය ප්‍රමාද වෙමින් පවතින නිසා, පසු IPC වලින් ඉතිරි ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කරන ලදී. කොන්ත්‍රාත්තුව එකවර ගෙවිය යුතු වර්ගයේ කොන්ත්‍රාත්තුවක් නිසා, ව්‍යුහය සැලකිය යුතු කොටසක් නිම කිරීමෙන් පසු පමණක් වැඩ තක්සේරු කෙරේ. එමනිසා, භාවිත කරන ලද වැරගැන්වීම් ප්‍රමාණය සිදු කළ වැඩවල වටිනාකම තුළින් නොපෙන්වයි.	විධිමත් පරික්ෂණයක් පවත්වා වැඩ බිමේ තිබෙන ද්‍රව්‍ය වලට ගෙවන විට කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේවායා යෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වී ඇතිද යන්න සහතික කල යුතුය.
(ඈ)	අංක 24/2008/713/009 සහ 2024 ඔක්තෝම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවෙහි (SCAPC) නිර්දේශ වලට දැඩිව යටත්	පහත සංශෝධනයන්ට යටත්ව පිළිගනිමි. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත පරිදි සංශෝධිත	වැඩ වල මුල් විෂය පථයේ සහ ඉංජිනේරු EPC ලංසු ලේඛණයන්හි නිවැරදිතාවය නිශ්චය

	වෙමින් සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) එකගතාවය අනුව වරාය පිවිසුම් ගුවන්මාර්ග (CW 01) හි සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 28,002.22 සිට රුපියල් මිලියන 68,337.22 දක්වා සංශෝධනය කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. ගාස්තු ගෙවීමේ මධ්‍යස්ථානය, සේවා ගොඩනැගිලි (04 බැවුම) සහ බැවුම 03 ඇතුළත්ව ලෝටස් වටරවුම - PAEH සම්බන්ධ මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා විචලන නියෝග අංක 60 ට අදාළව රුපියල් බිලියන 5.26 ඇතුළත්ව සංශෝධිත කොන්ත්‍රාත් මිලට රුපියල් බිලියන 5.91 ක් අතිරේක විචලනයක් ඇතුළත් කර ඇත. ප්ලාසා ගාස්තු ,සේවා ගොඩනැගිලි (බැවුම 04) සහ බැවුම 03 ඇතුළත්ව නෙළුම් වටරවුම - PAEH සම්බන්ධ මාර්ගය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ මුල් විෂය පථය තුළ ඇතුළත් කර නොමැති බව විචලනය ඉදිරිපත් කිරීම සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සහ කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථයට අදාල ලංසු ලේඛන 5B වෙළුමේ 5.7 අනුව දක්වා ඇත. ඒ අනුව, රුපියල් මිලියන 28,002.22 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමේ මාර්ගය භාවිතයේදී අවශ්‍ය මුලික පහසුකම් කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථයට අදාල ලංසු ලේඛණ ඇතුළත් කර නොතිබුණි.	කොන්ත්‍රාත් මුදල ශ්‍රී ලංකා රුපියල් මිලියන 52,579.66 ක් වේ. ශ්‍රී ලංකා රුපියල් මිලියන 68,337.22 ප්‍රතිලබ්ධියට අනුරූපී මුදල වේ. මුලික කොන්ත්‍රාත් විෂය පථයේ බෑවුම 3 සහ 4 සම්බන්ධිත මාර්ග, අධිවේගී මාර්ග ගාස්තු සහ සේවා ගොඩනැගිල්ල ඇතුළත් නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස, විචලන අංක 60 හඳුන්වා දෙන ලදී. මුලික විෂය පථය ප්‍රදේශයේ සමස්ථ සංවර්ධන සැලසුම අනුව පවතින කොන්දේසි මත සකසන ලදී.	කිරීමට විධිමත් පරීක්ෂණයක් සිදු කල යුතුය.
(ඉ)	PAEH ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස මෙම විෂය පථයන් ඇතුළත් කිරීම අවශ්‍ය බව SCAPC කමිටුව ප්‍රකාශ කර ඇත. කෙසේනමුත් 2024 සැප්තැම්බර් 03 අමාත්‍ය මණ්ඩල (අංක . 44/2024), සංදේශයේ ඇමුණුම V සහ 2024 අගෝස්තු 29 සහ 2024 සැප්තැම්බර් 02 දිනැති SCAPC කමිටු වාර්තා වල හඳුනා ගන්නා ලද විෂය පථය තුළ මෙම අත හැරීම ඇතුළත් කර නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, අමාත්‍ය මණ්ඩලයට සංදේශ ඉදිරිපත් කිරීම සඳහා අත්පොතේ (අංක 11/1288/558/03 සහ 2011 ජුනි 10) 3(v) වගන්තිය පරිදි “සංදේශයේ අවසාන පරිච්ඡේදයේ අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ඉල්ලා සිටිනු ලබන කරුණ විශේෂයෙන් දැක්විය යුතුය.” යන්න සඳහන් කර තිබුණද ප්‍රවාහන, මහා මාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ඊට අනුකූල වී නොමැත.	සමස්ථ සංවර්ධන සැලැස්ම සම්පූර්ණ නොකිරීම නිසා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන විට එම බැවුම්වල අඛණ්ඩතාවය සඳහා සැලසුම් අවසන් නොකිරීම නිසා බෑවුම් 03 සහ 04 සම්බන්ධිත මාර්ග මුල් විෂය පථයට ඇතුළත් කර නොමැත. එය අතපසු කිරීමක් නොවන අතර ප්‍රායෝගික තත්ත්වයකි. VO-60 මූලධර්මය සඳහා අනුමැතිය 2024 ජුනි 03 දින අමාත්‍ය මණ්ඩලයෙන් ලැබී ඇත.	අමාත්‍ය මණ්ඩලයට අදාළ සියළුම කරුණු පහසුවෙන් අවබෝධ කිරීමට සහ වඩාත් යෝග්‍ය තීරණ ගැනීමට හැකි වන පරිදී අවශ්‍ය තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශයක ඇතුළත් කළ යුතුය.
(ඊ)	ඉහත ඉදිරිපත් කිරීම සඳහා සාධාරණ මිල අඩු කිරීමක් ලබා ගැනීමට කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡා කරන	විචලන අංක 60 හි අනුපාතයන් ලබා ගෙන ඇත්තේ HSR	ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අතිරේක විචලනයක් සඳහා

	ලෙස 2024 අගෝස්තු 29 සහ 2024 සැප්තැම්බර් 02 දිනයන්හි පවත්වන ලද රැස්වීම් අංක Multi/Lat/03/2024 අනුව සහ අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) තීරණ අංක 02 සහ 03 හි නිර්දේශයන් පදනම්ව, උපදෙස් දෙන ලදී. කොන්ත්‍රාත්කරු සාකච්ඡා කර විසඳුමකට එකඟ නොවේ නම්, තරගකාරී ලංසු ක්‍රියාවලියක් හරහා වැඩ කර ගෙන යා යුතු බවට නිර්දේශ කෙරෙනි. කෙසේනමුත්, ඉහත SCAPC වාර්තාවට පෙර, බැවුම 3 සහ 4 සඳහා කොන්ත්‍රාත්කරු විසින් රුපියල් 6,780,058,054 ක් වූ අතිරේක විචලනයක් සඳහා පිරිවැය යෝජනාවක් 2024 අගෝස්තු 23 හා 2024 අගෝස්තු 26 දිනැති අංක SRM-JV/4 18/8447 සහ SRM-JV/4 18/8436 දරන ලිපි මගින් ලබා දී ඇත. පසුව, අංක SRM-JV/4-18/8561 සහ 2024 සැප්තැම්බර් 12 දිනැති ලිපිය මත ඉංජිනේරුවරයා/සේවායා විසින් දෙන ලද උපදෙස් අනුව කොන්ත්‍රාත්කරුගේ මුල් පිරිවැය වූ රුපියල් 6,780,058,054 ක යෝජනාව රුපියල් 1,508,094,14.92 ක් වූ අයිතම හතරක් ඉවත් කරමින් රුපියල් 5,261,570,878 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, ව්‍යාපෘතිය අතිරේක විචලනයක් සඳහා මිල අඩු කිරීමක් සාකච්ඡා කිරීමට SCAPC කමිටු තීරණ සහ අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුව කටයුතු නොකර ඒ වෙනුවට , විෂය පථයේ අඩු කිරීමක් පමණක් කර තිබුණි.	අනුපාත එකතු 25% පොදුකාර්ය සහ ලාභ සහ පවතින වෙළඳපොල අනුපාතයන් පදනම්ව වේ. මුදල තීරණය කිරීමට පෙර ඉංජිනේරුවරයා කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡා කර ඇත. ඊට අමතරව, ADB එකගතාවය ලැබීමෙන් පසු වැඩ පටන් ගැනීමට උපදෙස් නිකුත් කිරීමට පෙර අවසන් සාකච්ඡා පැවැත්වේ.	මිල අඩු කිරීමක් සාකච්ඡා කිරීමට SCAPC කමිටු තීරණයට හෝ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුගත වන බවට වග බලා ගත යුතු අතර විධිමත් පරික්ෂණයක් පවත්වා විචලන නියෝගය සකස් කිරීමේදී කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේවායාගේ අයිතිවාසිකම් සුරකී ඇති බවට සහතික කල යුතුය.
(උ)	අංක 24/2008/713/009 සහ 2024 ඔක්තෝබර් 28 දිනැති අමාත්‍ය මණ්ඩලය අනුමැතිය අනුව, අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණ අංක 02 සහ 03 සළකා බැලීමෙන් තොරව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අංක RDA/ADB/PAEHP/2-8-1/24-4661 සහ 2024 ඔක්තෝම්බර් 14 දිනැති ලිපිය හරහා අවසන් සංශෝධිත කොන්ත්‍රාත් මිල සඳහා එකගතාවය සඳහා ඉල්ලීම ADB වෙත යවන ලදී. කෙසේනමුත්, 2025 අප්‍රේල් 09 දක්වා කොන්ත්‍රාත් මිල සංශෝධනයට ආසියානු සංවර්ධන බැංකුවේ අදාළ එකගතාවය ලබා ගෙන නොතිබුණි.	ADB විශේෂඥවරයෙකු විසින් විචලන අංක 60 සමාලෝචනය කරන ලදී. ADB එකගතාවය ලැබීමෙන් පසු SCAPC විසින් අවසන් සම්මුතීන් සිදු කරනු ලැබේ.	ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අතිරේක විචලනයක් සඳහා මිල අඩු කිරීමක් සාකච්චා කිරීමට SCAPC කමිටු තීරණයට හෝ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුගත වන බවට වග බලා ගත යුතුය.
(ඌ)	කොන්ත්‍රාත්තුවේ 08 වන වෙළුමෙහි විශේෂ කොන්දේසි වල 13.8 උප වගන්තිය අනුව, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු කරන ලද වැඩ වල වටිනාකමේ විදේශ මුදල් කොටසට මිල ගැලපුමක්		

අදාළ නොවේ.කෙසේ නමුත්, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීමකට සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) තීරණය සහ අංක 23/2544/608/074-1 2024 ජනවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම්ව, මාර්ග සංවර්ධන අධිකාරිය සහ අදාළ කොන්ත්‍රාත්කරුවන් අතර විදේශ මුදල් සංරචකයේ පිරිවැයේ වෙනස්වීම් ගැලපුමට අදාළව වෙන්ව පරිපූරක ගිවිසුම් 02 ක් 2024 ජූලි 03 අත්සන් කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරෙනි.

i. ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව,යම් පරිපූරක ගිවිසුමකට ඇතුළත් වීමට පෙර ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගත යුතු බව දක්වා ඇත. කෙසේ නමුත්, ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතා ලිපිය අනුව, “ADB මිල සීමාවක් හඳුන්වා දීම සහතික කිරීමක් ලෙස අනුමැතිය නිර්වචනය නොකළ යුතු අතර ඒ වෙනුවට ADB එහි ප්‍රතිපත්තීන් උල්ලංඝණය කරන යෝජනා නොසපයන බවට” ඔවුන් දක්වා ඇත. මෙම ප්‍රකාශය මත පදනම්ව, මෙම කොන්දේසිමය එකඟතාවය කොන්ත්‍රාත්කරුවන් සමග පරිපූරක ගිවිසුම් අත්සන් කිරීමට පෙර අමාත්‍ය මණ්ඩලයට වෙත ඉදිරිපත් කිරීමට සහ නීතිපතිගේ මතය විමසීමට කටයුතු කර නොමැත.	ADB යෝජිත ගෙවීමට තමාගේ විරුද්ධත්වයක් නොමැති බවට පැහැදිලිව දන්වා ඇත. මිල වැඩි වීමට අදාළව අදහස් දක්වා ඇත. එනම්,ඇමරිකානු ඩොලර් මිල වැඩිවීම සඳහා පමණක් සීමිත ගෙවීම් වලින් පැන නගින යම් කරුණක් සම්බන්ධයෙන් ADB වග නොකියන බව වග බලා ගැනීමට ADB තම එකගතාවය ඇතුළත් කරන බව සාමාන්‍ය ප්‍රකාශයකි.	විධිමත් පරීක්ෂණයක් සිදු කර USD සංරචකය මත මිල වැඩි කිරීම ගෙවන විට කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේව්‍යයා යෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වී ඇති බවට සහතික කල යුතුය.
ii. රුපියල් 2,370,038,000 සහ රුපියල් 136,399,969 ක් වූ මිල විචලනයක් පිළිවෙලින් වරාය පිවිසුම් ගුවන්මාර්ග ව්‍යාපෘතිය සහ සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය සඳහා 2024 දෙසැම්බර් 31 දිනට, ගෙවන ලද අතර තවද, මිල වැඩි කිරීම් 02 ක් ඇමරිකානු ඩොලර් 4112.05 සහ 217,908.76 ක් 2025 අප්‍රේල් 09 දින ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, PAEH සඳහා එකග වූ මිල වැඩි කිරීම වූ ඇමරිකානු ඩොලර් මිලියන 08 කොන්ත්‍රාත්කරු විසින් අයකරගෙන තිබුණි. ඇමරිකානු ඩොලර් වියදම වැඩිවීමට එරෙහිව ආරක්ෂාව සලසන MFC සහ PAEHP සඳහා ස්ථාවර විනිමය අනුපාතිකය ඇමරිකානු ඩොලර් 01 ක් සඳහා පිලිවෙලින් රුපියල් 195.82ක් හා 161.98ක් බව 2023 නොවැම්බර් 27 දිනැති SCAPC කමිටු වාර්තාවේ දක්වා ඇත.නමුත්,පරිපූරක ගිවිසුමේ ගැලපීම ආරම්භ කළ දිනය වන 2023 මැයි 01 දිනෙන් පසු බලාපොරත්තු නොවූ උද්ධමනය නිසා මුලින් එකග වූ කොන්ත්‍රාත් මුදලේ ඇමරිකානු ඩොලර් වල අඩු විම	කොන්ත්‍රාත් මිල ශ්‍රී ලංකා රුපියල් සහ ඇමරිකානු ඩොලර් යන දෙයාකාරයෙන් ගෙවනු ලැබුවත් කොන්ත්‍රාත් මිල ශ්‍රී ලංකා රුපියල් වලින් පමණක් දක්වා තිබුණි. කොන්ත්‍රාත් කාලය තුළ මුල් කොන්ත්‍රාත් මිලහි දක්වා තිබෙන ඇමරිකානු ඩොලර් ප්‍රමාණය වෙනස් නොවන බවට වග බලා ගැනීමට ස්ථාවර විනිමය අනුපාත යොදා ගත යුතුය. ස්ථාවර විනිමය අනුපාත මිල වැඩිවීමට එරෙහිව කිසිම ආරක්ෂාවක් ලබා නොදේ. මුල් කොන්ත්‍රාත් මිලේ එකග වූ ඇමරිකානු ඩොලර් අඩු කිරීම සිදු නොවේ.ආනයන වල යම් මිල වැඩි කිරීමක් ඇමරිකානු ඩොලර් මිල වැඩි කිරීමෙන් ආවරණය වේ.	විධිමත් පරීක්ෂණයක් සිදු කර USD සංරචකය මත මිල වැඩි කිරීම ගෙවන විට කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේව්‍යයා යෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වී ඇති බවට සහතික කල යුතුය.

	සම්බන්ධයෙන් යම් ගණනය කිරීමක් කම්ටු වාර්තාවේ ඇතුලත් නොවිනි.		
	iii. SCAPC කම්ටු වාර්තාවේ 2.5 වගන්තිය සහ පරිපූරක ගිවිසුමේ 1 වන වගන්තිය අනුව, USD මගින් මිලට ගන්නා ලද ආනයන වල වැඩි වූ පිරිවැය සඳහා පමණක් මිල ගැලපුම් යොමු කර ඇත. නමුත්, එම ලිපිලේඛන 02 හි ඒවායේ මිල වැඩි විම තීරණය කිරීමට ශ්‍රමය,ද්‍රව්‍ය,පිරියත සහ වෙනත් ඇතුළත්ව සියලුම් යෙදවුම් මිල වැඩි කිරීම සඳහා ඉඩ දී ඇති අතර ඒ අනුව, මිල වැඩිකිරීම් සඳහා රුපියල් 2,370,038,000 සහ රුපියල් 136,399,969 ක් පිලිවෙලින් වරාය පිවිසුම් ගුවන්මාර්ග සහ සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය සඳහා ගෙවීම විගණනයේදී සතුටුදායක නොවන ලෙස සලකන ලදී.	කොන්ත්‍රාත්තුව අනුව, කොන්ත්‍රාත් මිලේ දේශීය සංරචකය සඳහා මිල වැඩි කිරීම ගෙවනු ලබන අතර එය 48.2% ක් වේ. කොන්ත්‍රාත් මිලේ USD සංරචකය (51.8%) ඔහුගේ විදේශ යෙදවුම් සඳහා පමණක් භාවිතා කෙරේ.	විධිමත් පරික්ෂණයක් සිදු කර USD සංරචකය මත මිල වැඩි කිරීම ගෙවන විට කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේවායා යෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වී ඇති බවට සහතික කල යුතුය.
	iv. තවද, කොන්ත්‍රාත් අංක RDA/ADB/OCB/PAEH/CW-01 සඳහා පරිපූරක ගිවිසුමේ දක්වා තිබෙන බර ප්‍රතිශතයන් මුල් කොන්ත්‍රාත් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිශතය සමග විසංවාදී බවක් නිරීක්ෂණය විය. උදාහරණයක් ලෙස, කොන්ත්‍රාත් ගිවිසුමේ 13.8 වගන්තිය අනුව, දේශීය මුදල් සංරචකයේ බිටුමන් බර තැබීම සියයට 0.69 ක් වේ. කෙසේනමුත්, පරිපූරක ගිවිසුමේ දක්වා ඇති පරිදි විදේශ මුදල් සංරචකයේ අස්ඵල්ට් සඳහා බර තැබීම සියයට 10 ක් වේ.	CIDA මිල වැඩිවීම් සූත්‍රය දේශීය සංරචකයේ වැඩ වල සමස්ථයට අදාළ කර ගත යුතුය. දේශීය සංරචකය සඳහා, මිල වැඩිවීම ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු ගණනය කෙරේ.කෙසේනමුත්, USD සංරචකය සඳහා එය 2023 මැයි 01 දිනට ක්‍රියාත්මක වන පරිදි පරිපූරක ගිවිසුමෙන් පසු ගණනය කෙරේ.	විධිමත් පරික්ෂණයක් සිදු කර USD සංරචකය මත මිල වැඩි කිරීම ගෙවන විට කොන්ත්‍රාත් කොන්දේසි (COC) අනුව සේවායා යෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වී ඇති බවට සහතික කල යුතුය.
(එ)	i. සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියට (SLPA) භාර දීම ප්‍රමාද වීම හේතුවෙන්, SLPA යේ දැනට සිටින කාර්යමණ්ඩලය බලමුළු ගැන්වීම සඳහා විචලතා නියෝග තුනක් යටතේ ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 340.87 ක් මුළු මුදලක් වැය කර ඇත. තවද, ඉහත ගෙවීම අනුමත විචලන සීමාව රුපියල් මිලියන 12.36 ක් ඉක්මවා යන බව නිරීක්ෂණය විය.	පිළිගතිමි.	COC අනුව, විචලතා පිරිවැය අඩු කිරීමට පියවර ගත යුතුය.
	ii. අතිරේකව,ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) විගණන සහ මාධ්‍ය ගොඩනැගිල්ල ඇතුළුව කුලියට ලබා ගත් ගොඩනැගිලි වල සහ SLPA සභාපතිතුමාගේ කාර්යාලය සඳහා කුලියට ගත් ගොඩනැගිලි වල විචලන සීමාවන් රුපියල් 164,301,454.05 කින් වැඩි කර තිබුණි.	පිළිගතිමි.	COC අනුව, විචලතා පිරිවැය අඩු කිරීමට පියවර ගත යුතුය.

3.3 අරමුදල් උපයෝජනය

	විගණන නිරීක්ෂණය	කළමනාරිත්වයේ අදහස් දැක්වීම්	විගණකගේ නිර්දේශය
(අ)	ණය ගිවිසුමේ මුල්‍යානය සඳහා එකග වූ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 293.89 න් 2024 දෙසැම්බර් 31 දක්වා මුළු ණය උපයෝජනය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 211 කට සමාන වූ රුපියල් මිලියන 60,780.38 ක් විය. ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 82.89 කට සමාන වූ රුපියල් මිලියන 24,251.95 ක මුදලක් උපයෝජනය කළ යුතුව ඇත.තවද, 2024 දෙසැම්බර් 31 දිනට ණය මුදලේ උපලබ්ධි නොවූ කොටස මත ප්‍රයාපන ගාස්තු ලෙස රුපියල් 430,922,200.71 ක් ණය දුන් නියෝජිතායතනයකට අනාර්ථික ලෙස ගෙවා ඇති බවට නිරීක්ෂණය විය.	2020 කාලය තුළ පැතිරුණු කොවිඩ් වසංගතය සහ පැවතුණු ආර්ථික කොන්දේසි නිසා ව්‍යාපෘතියේ අඩු ප්‍රගතියකට ප්‍රධාන වශයෙන් බලපාන ලදී.	ව්‍යාපෘති අධ්‍යක්ෂක ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියේ කාලින ඉලක්ක සපුරා ගන්නා බවට වග බලා ගත යුතුය.
(ආ)	සිවිල් වැඩ වල අඩු ප්‍රගතිය නිසා,සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා රජයේ අරමුදල් වෙන් කිරීම වූ රුපියල් මිලියන 30 න් ව්‍යාපෘතිය සියයට 87.76 ක් පමණක් උපයෝජනය කර ඇති අතර විදේශ අරමුදල් වෙන් කිරීම වූ රුපියල් මිලියන 20,000 න් සියයට 61.63 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.	පිළිගනිමි.මෙම තත්ත්වයට හේතු වූයේ VO-60 අනුමත කිරීම ප්‍රමාද වීම සහ MFC කොන්ත්‍රාත්තුවේ සෙමින් සිදු වූ ප්‍රගතිය වේ.	ව්‍යාපෘති අධ්‍යක්ෂක මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන අරමුදල් වලට සමගාමීව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියේ කාලින ඉලක්ක සපුරා ගන්නා බවට වග බලා ගත යුතුය.

3.4 නිෂ්ක්‍රිය වත්කම්

විගණන නිරීක්ෂණය	කළමනාරිත්වයේ අදහස් දැක්වීම්	විගණකගේ නිර්දේශය
(අ) මිල ඉහළයාම හේතුවෙන් පැනනැගුණු අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා ඇස්තමේන්තු වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 28.4 ක් වූ විද්‍යුත් ගාස්තු රැස් කිරීමේ පද්ධතිය (ETC) ක්‍රියාත්මක කිරීම අවලංගු කිරීමට 2023 පෙබරවාරි 02 වන දින ආසියානු සංවර්ධන බැංකුවේ එකගතාවය ව්‍යාපෘතිය මගින් ඉල්ලා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව එකඟතාවය ලබාදී තිබුණි. කෙසේවෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට මේ සම්බන්ධයෙන් දරන ලද මුළු වියදම රුපියල් මිලියන 176.48 ක් වේ.	කෙසේනමුත්, උපදේශක විසින් සකස් කරන ලද මූලික සැලසුම් සහ ලංසු ලේඛණ PPP පදනම මත පද්ධතියෙන් යෝජනා කැඳවීමේදී භාවිතා කරන ලදී.	ව්‍යාපෘති අධ්‍යක්ෂක විද්‍යුත් ගාස්තු රැස් කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද වියදම අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා දීමේ හැකියාවෙන් යුතු බවට සාධාරණීකරණය කරන බවට තහවුරු කර ගත යුතය.

(ආ) අංක CP 24/299/608/015 හා 2024 මාර්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් දී තිබෙන නිර්දේශයන් අනුව,අමාත්‍ය මණ්ඩලය පත් කළ සම්මුති කමිටුව (CANC) සහ ව්‍යාපෘති කමිටුව පත් කළ ඇති අතර PPP පදනම මත ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. 2024 නොවැම්බර් 12 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩලය පත් කළ සම්මුති කමිටු රැස්වීමේ අංක 07 සටහන් අනුව, මූල්‍ය ඇගයීම සඳහා එක් ලංසුකරුවෙක් තෝරා ගන්නා ලදී. කෙසේවෙතත්, 2022 වර්ෂයේදී කළමනාකරණය විශේෂයෙන් දක්වා ඇති පරිදි විකල්ප ක්‍රියාපරිපාටිය පදනම්ව ව්‍යාපෘතියට ETC පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.	මූල්‍ය ලංසුව ඇගයීම ක්‍රියාත්මක වෙමින් පවතී. CANC නිර්දේශ පරිදී, ආසියානු සංවර්ධන බැංකුවෙන් ආර්ථිකඥයෙක් ඉල්ලා සිටින ලදී.ප්‍රසම්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.	ව්‍යාපෘති අධ්‍යක්ෂක ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ආකාරයට ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කරන බවට සහතික විය යුතුය.

3.5 පද්ධති සහ පාලනයන්

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම්	විගණකගේ නිර්දේශය
මුදල් රෙගුලාසි අංක 137 සහ 138 අනුව,වවුචරයක් සහතික කිරීමට සහ අනුමත කිරීමට පෙර වගකිවයුතු නිලධාරියා වවුචරයක් නිවැරදි සහ සම්පූර්ණ බවට තහවුරු කර ගත යුතුය. කෙසේනමුත්, නියැදියක් ලෙස අප විසින් තෝරා ගත් 2024 ජනවාරි සිට ජුනි දක්වා මාස හයක කාලය තුළ,පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදී. i. එකතුව රුපියල් 432,584.15ක් වූ වවුචර 10ක් එකී වවුචර සකස් කිරීමේ දිනට පෙර සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කර තිබිණි. ii. එකතුව රුපියල් 277,350 ක් වූ වවුචර 04 ක් ගෙවීම් කළ දිනෙන් පසු සහතික කර තිබිණි. iii. එකතුව රුපියල් 3,627,921.09ක් වූ වවුචර 21ක් වවුචරය සඳහා ගෙවීම් දිනෙන් පසු අනුමත කිරීමේ නිලධාරියා විසින් අනුමත කර තිබිණි. iv. එකතුව රුපියල් 1,105,257.02ක් වූ වවුචර 05 ක අදාළ දිනයන් සහතික කිරීමේ සහ අනුමත කිරීමේ නිලධාරීන් විසින් දක්වා නොතිබිණි.	අනවධානයෙන් වවුචර වල සමහර වැරදි දින ලිය ඇති අතර අනාගතයේදී වවුචර්වල දින ඇතුළත් කිරීමේදී නිසි අවධානයක් යොමු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.	ව්‍යාපෘති ගණකාධිකාරී සියළු ගෙවීම් මුදල් රෙගුලාසි සමග අනුගත වන බවට තහවුරු කරගත යුතුය.